# කොළඹ තරුණ බෞද්ධ සංගමය

## බුද්ධ ධර්මය පිළිබඳ සහතික පත්‍ර විභාගය සහ ඩිප්ලෝමා විභාගය

**ව්‍යවස්ථා හා විෂය නිර්දේශ**

බු: ව: 2563 සිට ඉදිරියට
ක්‍රි: ව: 2020

**කොළඹ තරුණ බෞද්ධ සංගමයේ**

**බුද්ධ ධර්මය පිළිබඳ ඩිප්ලෝමා විභාගය**

**ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්ව විද්‍යාලයේ**

**බුද්ධ ධර්ම/පාලි ඩිප්ලෝමා විභාග සඳහා ප්‍රවේශ**

**සුදුසුකමක් වශයෙන් පිළිගැනීමට එහි පාලක සභාවේ**

**අනුමැතිය ලැබී ඇත.**

**කොළඹ තරුණ බෞද්ධ සංගමය මගින් පැවැත්වෙන**
**බුද්ධ ධර්මය පිළිබඳ සහතික පත්‍ර විභාගය සහ ඩිප්ලෝමා විභාගය**

# ව්‍යවස්ථා හා විෂය නිර්දේශ

(2020 සිට පවත්වනු ලබන විභාග සඳහා)

## 01. විභාගය පැවැත්වෙන දිනය :

සෑම වර්ෂයකම නොවැම්බර් මස දෙවැනි සෙනසුරාද විභාගය පැවැත්වේ.

## 02. විභාග මධ්‍යස්ථානය :

අයදුම්කරුවන්ගේ සංඛ්‍යාව අනුව විභාග මධ්‍යස්ථාන නියම කරනු ලැබේ.

## 03. විභාගය පවත්වන භාෂා මාධ්‍යය : (සිංහල භාෂාව)

## 04. අයදුම්පත් ලබා ගැනීම :

(1) කොළඹ තරුණ බෞද්ධ සංගමයෙන් නිකුත් කරනු ලබන නියමිත ආකෘති පත්‍ර මගින් මෙම විභාගය සඳහා ඉල්ලුම් කළ යුතුය.

(11) දහම් පාසල්, විදුහල් හෝ පිරිවෙන් මගින් ඉදිරිපත් කෙරෙන අයදුම්කරුවන් සඳහා ද, පෞද්ගලික අයදුම්කරුවන් සඳහා ද, අවශ්‍ය ඉල්ලුම් පත්‍ර ජූනි 20 වැනිද සිට ජූලි 20 වැනි දින දක්වා බොරැල්ලේ පිහිටි තරුණ බෞද්ධ සංගම් කාර්යාලයට පුද්ගලිකව පැමිණ හෝ තැපැල් මගින් හෝ අයදුම්පත් ලබා ගත හැකිය. තැපැල් මගින් අයදුම්පත් ලබා ගැනීමට නම් ඒ සඳහා තම ලිපිනය සඳහන් නියමිත මුද්දර ගැසූ දිග ලියුම් කවරයක් සමග ඉල්ලුම්

කළ යුතුය. (ආයතනයක් මගින් ඉල්ලුම් කරන විට එම ආයතනයෙන් ඉදිරිපත් වන අයදුම්කරුවන්ගේ සංඛ්‍යාව පළමුව දන්වා එවිය යුතුය. එවිට අවශ්‍ය ප්‍රමාණයට අයදුම්පත් එවනු ලැබේ.)

## 05. අයදුම්පත් ඉදිරිපත් කිරීම :

(1) ආයතනය මගින් ඉදිරිපත් කරන අයදුම්පත් ආයතන ප්‍රධානීන් විසින් ඉදිරිපත් කළ යුතුය. මෙම අයදුම්පත් පිටපත් දෙකකින් යුක්ත විය යුතුය. ආයතනවලින් ඉදිරිපත් වන අයදුම්කරුවන් පිළිබඳ ලිපි ගනුදෙනු සියල්ලක්ම ආයතන ප්‍රධානීන් මගින්ම විය යුතුය.

(11) අයදුම්පත් පැහැදිලිව ද, නිවැරදිව ද, සම්පූර්ණ කළ යුතුය. එසේ නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(111) සම්පූර්ණ කරන ලද සියළුම අයදුම්පත් කොළඹ තරුණ බෞද්ධ සංගමයේ ධර්ම පරීක්ෂණ පිළිබඳ ගරු ලේකම්, කොළඹ තරුණ බෞද්ධ සංගමය, අංක 70, ඩී. එස්. සේනානායක මාවත, කොළඹ 08 යන ලිපිනයට එවිය යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ වම් පස උඩ කෙළවරේ විභාගයේ නම සඳහන් කළ යුතුය. සුදුසුකම් නැති හෝ අසම්පූර්ණ හෝ ප්‍රමාදව හෝ ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරෙනු ඇත.

(1V) කිසිම සහතිකයක් අයදුම්පත් සමග නො එවිය යුතුයි. අදාළ සහතික හෝ සුදුසුකම් ඇති බවට අයදුම් පත් සහතික කරන තැනැත්තා (පරිවෙණාධිපති, ප්‍රධානාචාර්ය හෝ විදුහල්පති) සෑහීමට පත් විය යුතුය.

## 06. ප්‍රවේශ පත්‍ර :

ඔක්තෝම්බර් මස 30 වෙනි දින හෝ ඊට පෙර ලැබෙන සේ ආයතනවලට සහ පෞද්ගලික අපේක්ෂකයන් වෙත ප්‍රවේශ පත්‍ර තැපැල් මගින් එවනු ලැබේ. එසේ ඒවා නොලැබුණහොත්, ආයතන ප්‍රධානීන්/පෞද්ගලික අපේක්ෂකයින් "ධම්ම" කොළඹ 08 යන ලිපිනයට විදුලි පුවතක් එවා හෝ පෞද්ගලිකව පැමිණ හෝ විමසිය යුතුය. (දුරකථන අංකය - 2695786) ඒ සඳහා පහත සඳහන් විස්තර අවශ්‍ය වේ.

(1) ආයතනයේ / අයදුම්කරුගේ නම

(11) සම්පූර්ණ ලිපිනය

(111) ඉල්ලුම් පත්‍රය එවූ දිනය, එය ලියාපදිංචි කළ අංකය හා තැපැල් ස්ථානය.

## 07. අනන්‍යතාවය තහවුරු කිරීම :

අයදුම්කරුවන් පරීක්ෂණයට පෙනී සිටින සෑම දිනකම පෙරවරුවේ ද පස්වරුවේ ද පහත සඳහන් හැඳින්වීමේ පත්‍රිකාවලින් එකක් ඉදිරිපත් කළ යුතුය.

(1) පෝස්ට්මාස්ටර් ජනරාල් විසින් නිකුත් කරන ලද හැඳින්වීමේ පත්‍රිකාව.

(11) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් විසින් නිකුත් කරන ලද හැඳින්වීමේ පත්‍රිකාව.

(111) සංස්කෘතික දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද භික්ෂු හැඳින්වීමේ පත්‍රිකාව.

(1V) අයදුම්පත සහතික කරන පුද්ගලයා විසින් සහතික කරනු ලබන ඡායාරූපයේ පසු පැත්තේ අපේක්ෂකයාගේ නම, ලිපිනය සහ පුරුදු අත්සන යෙදූ පාස්පෝට් ප්‍රමාණයේ ඡායාරූපයක්.

(V) විදේශීය ගමන් බල පත්‍රයක් හෝ මෝටර් රියැදුරු බලපත්‍රයක්.

## 08. විභාග පටිපාටිය :

ධම්ම, අභිධම්ම, පාලි බෞද්ධ ශිෂ්ටාචාරය හා සංස්කෘතිය යන විෂයයන් සඳහා සහතික පත්‍ර සහ ඩිප්ලෝමා තත්වයේ පරීක්ෂණ පහත දැක්වෙන පරිදි පවත්වනු ලැබේ.

1. ථෙරවාද බුද්ධ ධර්මය පිළිබඳ සහතික පත්‍ර පරීක්ෂණය

විෂයයන් - බුද්ධ ධර්මය
අභිධර්මය
පාලි
බෞද්ධ ශිෂ්ටාචාරය හා සංස්කෘතිය

11. ථෙරවාද බුද්ධ ධර්මය පිළිබඳ ඩිප්ලෝමා පරීක්ෂණය

විෂයයන් - බුද්ධ ධර්මය
අභිධර්මය
පාලි
බෞද්ධ ශිෂ්ටාචාරය හා සංස්කෘතිය

සහතික පත්‍ර හෝ ඩිප්ලෝමා පරීක්ෂණයන්හි විෂයයන් 4 ටම හෝ විෂයයන් 3 කට හෝ 2 කට හෝ එක් විෂයයකට හෝ තම අභිමතය පරිදි පෙනී සිටිය හැකිය. සමත් වන විෂයයන්ට පමණක් සහතික නිකුත් කරනු ඇත.

පරීක්ෂණ වලට පෙනී සිටීමට බාහිර අයදුම්කරුවන්ට ද අවසර ලැබේ. බාහිර අයදුම්කරුවන් ප්‍රසිද්ධ දැන්වීමකින් නිවේදනය කෙරෙන පරිදි අයදුම් කළ යුතුය.

කොළඹ තරුණ බෞද්ධ සංගමය විසින් පවත්වනු ලබන පංති වලට සහභාගී නොවන අය බාහිර අයදුම්කරුවන් ලෙස සැලකේ.

යථෝක්ත පරීක්ෂණ වලට පෙනී සිටීම සඳහා නාමික ගාස්තුවක් අය කරනු ඇත.

සියළුම පරීක්ෂණ නොවැම්බර් මාසයේ දෙවැනි සෙනසුරාද පැවැත්වේ. පුන් පොහෝ දිනවල පරීක්ෂණ නොපැවැත්වේ.

## 09. සහතික පත්‍ර පරීක්ෂණය

පහත දක්වා ඇති සුදුසුකම් අතුරෙන් එකක්වත් අයදුම්කරුවෙකුට තිබිය යුතුය.

(1) රජයේ පාසල් වල සහ දහම් පාසල් වල 10 වෙනි ශ්‍රේණියේ බුද්ධ ධර්මය සමත් වීම හෝ.

(11) රජය මගින් පිළිගත් කණිෂ්ඨ පිරිවෙණක අවසාන පන්තියෙන් සමත්වී සිටීම හෝ.

(111) විද්‍යාලංකාර පිරිවෙණේ හෝ විද්‍යෝදය පිරිවෙණේ පස්වන වර්ෂයේ විභාගයෙන් සමත්වීම හෝ.

## 10. ඩිප්ලෝමා පරීක්ෂණය සඳහා සුදුසුකම්

### I. බුද්ධ ධර්මය

අ) සහතික පත්‍ර පරීක්ෂණයේ බුද්ධ ධර්මය විෂයයෙන් සමත්වීම.

### II. අභිධර්මය

ආ) සහතික පත්‍ර පරීක්ෂණයේ අභිධර්මය විෂයයෙන් සමත්වීම හෝ

ඇ) විද්‍යෝදය පිරිවෙණස්ථ ශ්‍රී සුමංගල ගුණානුස්මරණ සභාව මගින් පවත්වනු ලබන අභිධම්මාචරිය උපාධි ප්‍රාරම්භ පරීක්‍ෂණයෙන් සමත්වීම.

## III. <u>පාලි</u>

අ) සහතික පත්‍ර පරීක්‍ෂණයේ පාලි විෂයයෙන් සමත්වීම හෝ

ආ) විද්‍යෝදය පිරිවෙණස්ථ ශ්‍රී සුමංගල ගුණානුස්මරණ සභාව මගින් පවත්වනු ලබන පාලි ප්‍රාරම්භ පරීක්‍ෂණයෙන් සමත්වීම.

## IV. <u>බෞද්ධ ශිෂ්ඨාචාරය හා සංස්කෘතිය</u>

අ) සහතික පත්‍ර පරීක්‍ෂණයේ බෞද්ධ ශිෂ්ටාචාරය හා සංස්කෘතිව විෂයයෙන් සමත්වීම.

## II. ථෙරවාදි බුද්ධ ධර්මය පිළිබඳ සහතික පත්‍ර පරීක්‍ෂණය
## පාඨමාලා කාලය - වර්ෂ එකකි.
## බුද්ධ ධර්මය - විෂය නිර්දේශය
## (විභාග ප්‍රශ්න පත්‍රයේ කාලය - පැය 3 කි.)

1. බුද්ධ චරිතයේ වැදගත් සිද්ධි හා අවස්ථා - උත්පත්තිය, අභිනිෂ්ක්‍රමණය, බුද්ධත්වයට පත්වීම, මහා පරිනිර්වාණය.
2. සුවිසි මහා බුදුගුණ
3. ප්‍රථම ධර්ම දේශනාව හා එහි අන්තර්ගත ධර්ම.
4. ධර්ම සංගායනා (ථෙරවාදී ධර්ම සංගායනා සය)
5. ත්‍රිපිටකය පිළිබඳ දැනුම, සූත්‍ර විනය පිටකයන්ට අයත් ග්‍රන්ථ සහ අටුවා ග්‍රන්ථ.

6. සිඟාලෝවාද, ව්‍යග්ගපජ්ජ, පරාභව, වසල, ධම්මික සූත්‍ර ඇසුරෙන් බෞද්ධ සමාජ සදාචාර දර්ශනය.
7. කර්මය හා කර්ම විපාක
8. දස කුසල, දස අකුසල, දස පුණ්‍යක්‍රියා පිළිබඳ සාමාන්‍ය විස්තරයක්
9. දස පාරමිතා ඒ ඒ පාරමිතාවන්ට අදාළ ජාතක කතා සමග.
10. පංචනීවරණ, සමසතලිස් කර්මස්ථාන
11. සමථ භාවනාව, අෂ්ට සමාපත්ති
12. සූත්‍ර ධර්ම - රතන සූත්‍රය, කරණීයමෙත්ත සූත්‍රය, මහා මංගල සූත්‍රය, ධජග්ග සූත්‍රය
13. ධම්මපද ගාථා - අර්ථය හා අන්තර්ගත ධර්ම. (නිධාන කථා සමග)

    ගාථා අංක :- 1, 2, 3, 4, 5, 12, 13, 14, 16, 21, 22, 24, 25, 28, 31, 33, 37, 41, 43, 50, 53, 60, 61, 70, 71, 82, 85, 87, 89, 109
14. මහින්දගමනය හා එහි බලපෑම

**නිර්දේශිත ග්‍රන්ථ** - මහාචාර්ය රේරුකානේ චන්දවිමල ස්වාමින් වහන්සේගේ පහත සඳහන් ග්‍රන්ථ :

1. චතුරාර්‍ය සත්‍යය
2. පාරමිතා ප්‍රකරණය
3. පටිච්ච සමුප්පාද විවරණය
4. නිර්වාණ විනිශ්චය හා පුනරුත්පත්ති ක්‍රමය
5. සුවිසි මහා ගුණය
6. මංගල ධර්ම විස්තරය
7. ධර්ම සංග්‍රහය - නාරද හිමි

## 12. ථෙරවාද බුද්ධ ධර්මය පිළිබඳ සහතික පත්‍ර පරීක්ෂණය

## අභිධර්ම ප්‍රශ්න පත්‍රය සඳහා

## විෂය නිර්දේශය - කාලය පැය 3.00 - ප්‍රශ්න පත්‍ර 1 කි.

1. අභිධර්මයේ ඉතිහාසය, අභිධර්මයේ විශේෂත්වය, අභිධර්ම පිටකය හා සූත්‍ර පිටකය අතර වෙනස, අභිධර්ම ප්‍රකරණ සහ අටුවා ග්‍රන්ථ

2. ප්‍රඥප්තිය හෙවත් සම්මුති සත්‍යය සහ පරමාර්ථ සත්‍යය

3. චිත්ත පරමාර්ථය - සිත් 89/121 අධ්‍යයනය.

4. චෛතසික පරමාර්ථය - චෛතසික 52 රාශි වශයෙන් සහ ප්‍රභෙද වශයෙන් බෙදා දැක්වීම.

5. රූප පරමාර්ථය - මහා භූතරූප සහ උපාදාය රූප, රූප සමුද්දේසය

6. නිබ්බාණ පරමාර්ථය - නිර්වාණ සුඛයෙහි උසස් බව, නිර්වාණයාගේ විශාලත්වය, නිවණට පැමිණෙන ආකාරය, නිර්වාණයාගේ ප්‍රභේද

7. ප්‍රකීර්ණක පාදය - සම්ප්‍රයුක්ත, වේදනා, හේතු, කෘත්‍ය යන සංග්‍රහයන්

8. වීථි මුක් ත පාදය - චතුෂ්ක සතර, චතුර්විධ භූමි, චතුර්විධ ප්‍රතිසන්ධි, චතුර්විධ කර්ම, චතුර්විධ මරණොත්පත්ති, නියාම ධර්ම.

9. අකුසල සංග්‍රහය - ආසව, ඕඝ, යෝග, ග්‍රන්ථ, උපාදාන, නීවරණ, අනුශය, සංයෝජන, කිලෙස

10. සත් තිස් බෝධිපාක්ෂික ධර්ම නාම මාත්‍ර වශයෙන්

11. සමුච්චය සංග්‍රහය - පංචස්කන්ධය, පංච උපාදානස්කන්ධය, ආයතන දෙළස, ධාතු 18, ආර්‍ය්‍ය සත්‍ය සතර.

12. පටිච්ච සමුප්පාදය පිළිබඳ සාමාන්‍ය හැඳින්වීමක්

**<u>නිර්දේශිත ග්‍රන්ථ</u>**

1. අභිධර්ම චන්ද්‍රිකාව (කොළඹ තරුණ බෞද්ධ සංගමයේ ප්‍රකාශන අංක 1, 2, 3 ) - මාතර ශ්‍රී ධර්මවංශ ස්වාමින් වහන්සේ

2. අභිධර්ම මාර්ගය - මහාචාර්ය රේරුකානේ චන්දවිමල ස්වාමින් වහන්සේ

3. චතුරාර්ය සත්‍යය - මහාචාර්ය රේරුකානේ චන්දවිමල ස්වාමින් වහන්සේ

4. අභිධර්මාර්ථ ප්‍රදීපිකා (පළමුවන කාණ්ඩය) - වෛද්‍ය අමරදස රත්නපාල මහතා

## 13. පාලි භාෂා සහතික පත්‍ර පරීක්ෂණය

## විෂය නිර්දේශය : (කාලය පැය 03 කි. ප්‍රශ්න පත්‍ර 01)

### පාඨමාලා කාලය වසර 01 කි.

01. පාලි භාෂාවේ අක්ෂර මාලාව පිළිබඳ මූලික අවබෝධයක්.
02. නාම පද වරනැගීම හා ක්‍රියාපද වරනැගීම.
03. නිපාත හා උපසර්ග පද භාවිතය
04. නාම විභක්ති හා ක්‍රියා විභක්ති පද හඳුනා ගැනීම.
05. සංඛ්‍යාවාචී පද භාවිතය.
06. සරල වාක්‍ය ප්‍රයෝග
07. සන්ධි, සමාස, තද්ධිත පද පිළිබඳ මූලික අවබෝධයක්.
08. ප්‍රායෝගික පාලි පාඨ සිංහලට පරිවර්තනය කිරීම.

09. අග්ගමහා පණ්ඩිත පොල්වත්තේ බුද්ධදත්ත හිමිපාණන්ගේ පාලි භාෂාවතරණය 1 වන කාණ්ඩය.

10. රසවාහිනියේ පළමු කථා දහය.

11. අග්ගමහා පණ්ඩිත පොල්වත්තේ බුද්ධදත්ත හිමිපාණන්ගේ පාලි පාඨාවලී 1 වන පොත.

## **14. බෞද්ධ ශිෂ්ඨාචාරය හා සංස්කෘතිය**

## **සහතික පත්‍ර පරීක්ෂණය - (ප්‍රශ්න පත්‍රය - කාලය පැය 3)**

## **විෂය නිර්දේශය**

01. බුද්ධ කාලීන භාරතීය සමාජ සංයුතිය - සමාජ ස්ථරායනය හා වර්ණ හා ආශ්‍රම ධර්ම - බුදුසමයේ බලපෑම.

02. බෞද්ධ ආචාර ධර්ම සහ පිළිවෙත් රැකීම.

03. බෞද්ධ සමාජ සංකල්පය.

04. භාරතීය සමාජයෙහි කාන්තාවට හිමි වූ තැන - බුදුන් වහන්සේ සලසාදුන් කාන්තා විමුක්තිය - විවාහ ජීවිතය පිළිබඳ බෞද්ධ උපදේශ.

05. පුද්ගලයා හා සමාජය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම්.

06. යුතුකම් හා අයිතිවාසිකම් පිළිබඳ බෞද්ධ ඉගැන්වීම්.

07. බෞද්ධ සෞන්දර්ය සංකල්පය හා බෞද්ධ දර්ශනයේ ස්වාභාවික පරිසරයට හිමි විශේෂ ස්ථානය.

08. බෞද්ධ ගෘහනිර්මාණ ශිල්පය - ප්‍රතිමා ඝර, චෛතිය ඝර, බෝධිඝර, විහාර චිත්‍ර සහ සඳකඩ පහණ

09. බෞද්ධ ස්තූපයේ ප්‍රභවය - ලක්ෂණ හා ප්‍රමිතීන්

10. ප්‍රාග් මහින්ද යුගයේ ලංකාවේ ඇදහීම්.

**<u>නිර්දේශිත ග්‍රන්ථ</u>**

1. බුද්ධ චරිතය (පූජ්‍ය නාරද ස්වාමින් වහන්සේ)
2. බුද්ධ චරිතය (බලංගොඩ ආනන්ද මෛත්‍රී ස්වාමින් වහන්සේ)
3. බුදු හාමුදුරුවෝ (ගනේගම සරණංකර ස්වාමින් වහන්සේ)
4. බෞද්ධ අත්පොත (මහානායක මඩිහේ පඤ්ඤාසීහ ස්වාමින් වහන්සේ)

## 15. බුද්ධ ධර්මය පිළිබඳ ඩිප්ලෝමා පරීක්ෂණය

### විෂය නිර්දේශය - බුද්ධ ධර්මය

**(විභාග ප්‍රශ්න පත්‍රයේ කාලය - පැය 3 කි.) ප්‍රශ්න පත්‍ර 1 කි.**

1. දස තථාගත බල හා ෂඩ් අසාධාරණ ඥාණ
2. ධම්ම චක්ක පවත්තන සූත්‍රය.
3. පුනර්භවය තහවුරු කිරීමට සාධක
4. බුද්ධ කාලීන අන්‍ය ශාස්තෘවරයින්ගේ ඉගැන්වීම් හා දර්ශන.
5. විනය පිඨකයේ ග්‍රන්ථ කොටස් සහ අටුවා ග්‍රන්ථ
6. පටිච්ච සමුප්පාදය
7. නිර්වාණය හා නිර්වාණ ගාමිණී පටිපදාව
8. සප්ත විසුද්ධිය
9. බුදු සමයේ දේශාන්තර ව්‍යාප්තිය.
10. බුද්ධ ශාසනය නිකාය වශයෙන් බෙදීයාම.
11. විදර්ශනා භාවනා මහාසතිපට්ඨාන සූත්‍රය (සංක්ෂිප්ත)
12. සූත්‍ර ධර්ම - චුල්ලකම්මවිභංග සූත්‍රය, කාලාම සූත්‍රය, මහාගෝපාලක සූත්‍රය, මදු පිණ්ඩික සූත්‍රය
13. බුද්ධ ධර්මය ශ්‍රී ලංකාවට හඳුන්වාදීම හා එය සිංහල ජාතියේ උන්නතියට බලපෑ අන්දම.
14. බෞද්ධ දර්ශනයේ විද්‍යාත්මක පදනම

**<u>නිර්දේශිත ග්‍රන්ථ</u>** - මහාචාර්‍ය රේරුකානේ චන්‍දවිමල ස්වාමින් වහන්සේගේ පහත සඳහන් ග්‍රන්ථ

1. ශාසනාවතරණය
2. විදර්ශනා භාවනා ක්‍රමය
3. චතුරාර්‍ය්‍ය සත්‍යය
4. නිර්වාණ විනිශ්චය හා පුනරුත්පත්ති ක්‍රමය

## 16. ථෙරවාද, බුද්ධ ධර්මය පිළිබඳ ඩිප්ලෝමා පරීක්ෂණය

## අභිධර්ම විභාගය සඳහා නිර්දේශ පත්‍රය

## කාලය පැය 3.00 - ප්‍රශ්න පත්‍ර 1 යි.

| | | |
|---|---|---|
| 1. | චිත්තපාදය - | ද්විවිධ දේශනා, චතුර්විධ අභිධර්මාර්ථ හෙවත් සතර 'පරමාර්ථ ධර්ම, චාතුර්භූමක සිත්, චිත්තපාදය භූමි, ජාති' භේදාදියෙන් බෙද දැක්වීම ඇතුළු සවිස්තරාත්මක අධ්‍යයනය. |
| 2. | චෛතසික පාදය - | සම්ප්‍රයෝග නය සහ සංග්‍රහ නය |
| 3. | ප්‍රකීර්ණක පාදය - | ද්වාර, ආලම්බන, වස්තු යන සංග්‍රහයන් |
| 4. | වීථි පාදය - | ෂට්ක සය, පඤ්චද්වාරික චිත්තවීථි, මනෝද්වාරික චිත්තවීථි, අර්පණා චිත්තවීථි, අර්පණා නියමය, තදාලම්බන නියමය, ජවන නියමය, පුද්ගල භේදය, භූමි විභාගය. |

5. වීථි මුක්ත පාදය - චතුෂ්ක සතර, චතුර්විධ භූමි, රූප භූමි හා අරූප භූමි, චතුර්විධ ප්‍රතිසන්ධි, රූපාවචර අරූපාවචර ප්‍රතිසන්ධි, චතුර්විධ කර්ම, චතුර්විධ කර්මයන්ගේ විපාක ස්ථාන, චතුර්විධ මරණෝත්පත්ති. මරණාසන්න චිත්ත වීථි

6. රූප පාදය - සතර මහා භූත රූප සහ උපාදය රූප, රූප සමුද්දේසය, රූප විභාගය, රූප සමුට්ඨාන, රූප කලාප, රූප ප්‍රවෘත්ති ක්‍රම, නිර්වාණය.

7. සමුච්චය පාදය - වස්තු ධර්ම සහ චතුර්විධ සංග්‍රහ, අකුසල සංග්‍රහය, මිශ්‍රක සංග්‍රහය, බෝධිපාක්ෂික ධර්ම.

8. පටිච්ච සමුප්පාදය - පටිච්ච සමුප්පාද ධර්ම, සූවිසි පට්ඨාන ධර්ම, ත්‍රිරාශිය ඇතුළුව

9. කර්මස්ථාන පාදය - සමථ විදර්ශනා භාවනා, චරිතානුකූල කර්මස්ථාන, සම සතලිස් කර්මස්ථාන, විදර්ශනා කර්මස්ථාන, සප්ත විසුද්ධි, පුද්ගල භේද, සමාපත්ති භේද.

## නිර්දේශිත ග්‍රන්ථ

1. අභිධර්ම චන්ද්‍රිකාව 1, 2, 3 කොටස් - මාතර ශ්‍රී ධර්මවංශ ස්වාමින් වහන්සේ
2. චතුරාර්‍ය්‍ය සත්‍යය - මහාචාර්‍ය්‍ය රේරුකානේ චන්දවිමල ස්වාමින් වහන්සේ
3. අභිධර්ම මාර්ගය - මහාචාර්‍ය්‍ය රේරුකානේ චන්දවිමල ස්වාමින් වහන්සේ

## 17. පාලි භාෂාව පිළිබඳ ඩිප්ලෝමා පරීක්ෂණය
## විෂය නිර්දේශය

### (කාලය පැය 03 යි ප්‍රශ්න පත්‍ර 01 යි)

**සුදුසුකම් :**

01. පාලි භාෂාවේ මූලික ව්‍යාකරණ අංග පිළිබඳ යම් අවබෝධයක් මෙහිදී අපේක්ෂා කරනු ලැබේ.

පාලි ව්‍යාකරණය පිළිබඳ සාමාන්‍ය දැනුමක් මෙහිලා අපේක්ෂා කරනු ලැබේ.

1. පාලි භාෂාව හා ව්‍යාකරණය
2. පාලි භාෂාව හා සාහිත්‍යය

1. පාලි භාෂාව හා ව්‍යාකරණය

01. පාලි භාෂාවේ ව්‍යාප්තිය හා සංවර්ධනය පිළිබඳ මූලික අවබෝධයක්.
02. පාලි වර්ණමාලාව හා එහි සංයුතිය පිළිබඳ විග්‍රහයක්.
03. නාම වරනැගීම හා නාම පදයේ සුවිශේෂතා පිළිබඳ අවබෝධයක්.
04. සන්ධි, සමාස, තද්ධිත, කෘදන්ත යන ව්‍යාකාරණාංග පිළිබඳ විග්‍රහයක්.
05. ක්‍රියා පද වරනැගීම හා ක්‍රියාපද භාවිතය පිළිබඳ අවබෝධයක්.
06. කාරක ලක්ෂණ හා විවිධ භාෂා ප්‍රයෝග භාවිතය පිළිබඳ විග්‍රහයක්.

07. පාලි භාෂාවෙන් සිංහලට හා සිංහල භාෂාවෙන් පාලියට නියමිත පාඨ හා අනියමිත පාඨ පරිවර්තනය කිරීම.

8. අග්ගමහා පණ්ඩිත පොල්වත්තේ බුද්ධදත්ත හිමිපාණන්ගේ පාලි භාෂාවතරණය දෙවැනි පොත.

## 2. පාලි භාෂාව හා සාහිත්‍යය

පාලි ත්‍රිපිටකය පිළිබඳ මූලික අවබෝධයක් මෙහිදී අපේක්ෂා කරනු ලැබේ.

1. පාලි ත්‍රිපිටකයෙන් උපුටා ගත් කොටස් සිංහලට පරිවර්තනය කිරීම.

2. ධම්ම පදට්ඨ කතාවේ 1 - 10 වග්ග.

3. නියමිත ග්‍රන්ථ හා සමාන තත්වයෙන් යුත් පාලි සාහිත්‍යගත කෘති වලින් උපුටා ගත් කොටසක් සිංහලට පරිවර්තනය කිරිම.

**නියමිත පාඨ**

1. මජ්ඣිම නිකාය, අරිය පරියෙසන සූත්‍රය
2. උදන පාලි ජච්චන්ධ වග්ග.
3. ධම්මපදය 1 - 10 වග්ග.
4. දීඝ නිකාය මහා පරිනිබ්බාන සූත්‍රය (භාණවාර 4 - 5)
5. විනය මහා වග්ග මහාඛන්ධක (භාණවාර 1 - 2)

නියමිත ග්‍රන්ථයන්ගෙන් උපුටා ගත් කොටස් සිංහලට පරිවර්තනය කිරීමේ හැකියාව ද, එම ග්‍රන්ථයන්හි ඇතුළත් බෞද්ධ ඉගැන්වීම් ඓතිහාසික හා සංස්කෘතික තොරතුරු පිළිබඳ අවබෝධයද මෙහිදී අපේක්‍ෂා කරනු ලැබේ. ග්‍රන්ථාගත අර්ථාවබෝධය, භාෂා ප්‍රයෝග, ශෛලීය හා සාහිත්‍යමය අගය ගැනද අවධානය යොමු කරවනු ලැබේ.

**18.** **ඩිප්ලෝමා පරීක්‍ෂණය**

**බෞද්ධ ශිෂ්ඨාචාරය හා සංස්කෘතිය**

**(ප්‍රශ්න පත්‍රය - පැය 03)**

**විෂය නිර්දේශය**

1. සමාජ සංස්ථාවේ ප්‍රභවය හා විකාශනය පිළිබඳ බෞද්ධ විග්‍රහය.
2. රාෂ්ට්‍ර පාලනය හා සමාජ සංවිධානය - අදාල සූත්‍රවල අන්තර්ගතය.
3. බෞද්ධ දේශපාලන චින්තනය.
4. බෞද්ධ ආර්ථික චින්තනය - ධනෝපායනය හා පරිභෝජනය
5. භික්‍ෂු විනය හා ගිහි ආචාර ධර්ම පිළිවෙත් රැකීම පදනම් කරගත් බෞද්ධ නීති හා අධිකරණ පද්ධතිය.
6. මහා වංශය හා අනෙක් ඉතිහාස ග්‍රන්ථ තුලින් හෙළිවන ථෙරවාද ශාසනයේ සංවර්ධනය හා ව්‍යාප්තිය.
7. මහා වංශය සහ දීප වංශය වැනි ඉතිහාස ග්‍රන්ථ තුලින් හෙලිවන කරුණු සනාථ කරන පුරාවිද්‍යා සහ අනෙකුත් මාධක.
8. සිංහල සාහිත්‍යයට බුද්ධ ධර්මයෙන් ලැබුණ පෝෂණය.

9. බුද්ධ ප්‍රතිමාවේ නිර්මාණය - විකාශය - ශෛලි හා ප්‍රමිතීන්, බෞද්ධ ප්‍රතිමාවල සුවිශේෂ ලක්‍ෂණ.
10. බෞද්ධ ආරාමික නිර්මාණ, සඳකඩපහණ, මුරගල, කොරවක්ගල, වාහල්කඩ, වාමන රූප.

**11. අධ්‍යාත්මික නිදහස් චින්තනයට බුදු දහමින් ලබා දී ඇති වැදගත් ස්ථානය.**

## නිර්දේශිත ග්‍රන්ථ

බෞද්ධ ආර්ථික දර්ශනය - ආචාර්ය ධර්මසේන හෙට්ටිආරච්චි

බෞද්ධ සමාජ දර්ශනය, බෞද්ධ ඉතිහාසය සහ බෞද්ධ සංස්කෘතිය - කර්තෘ ආචාර්ය අයි. එස්. ගමගේ

මහා වංශය - දීප වංශය ඇතුළු අනිකුත් වංශ කතා

## 19. පුහුණු පන්ති

විෂය හතර සඳහා පුහුණු පන්ති සෙනසුරාද දිනවල ප. ව. 1.30 සිට 6.30 දක්වා, කොළඹ තරුණ බෞද්ධ සංගමයේ තෙවන මහලේ පංති කාමරයේ දී පහත දැක්වෙන පරිදි පැවැත්වේ.

| | |
|---|---|
| පාලි | - ප. ව. 1.30 - 2.30 |
| බුද්ධ ධර්මය | - ප. ව. 2.30 - 3.30 |
| අභිධර්මය | - ප. ව. 3.30 - 4.30 |
| බෞද්ධ ශිෂ්ඨාචාරය හා සංස්කෘතිය | - ප. ව. 4.30 - 5.30 |

පංති පැවැත්වීම සෑම වර්ෂයකම ජනවාරි මාසයේ දෙවැනි හෝ තෙවැනි සෙනසුරාද ආරම්භ වේ. පුන් පොහෝ දිනවල පංති නොපැවැත්වේ.

පුහුණු පන්ති වලට සහභාගී වන්නන් ගෙන් පාඨමාලා ගාස්තු වශයෙන් නාමික මුදලක් අය කරනු නොලැබේ.

*****

ධර්ම පරීක්ෂණ පිළිබඳ ගරු ලේකම්
කොළඹ තරුණ බෞද්ධ සංගමය
70, ඩී. එස්. සේනානායක මාවත,
බොරැල්ල - කොළඹ 08.
ශ්‍රී ලංකාව.

දුරකථන අංකය - +940112695786
ෆැක්ස් - 940112682397

විද්‍යුත් තැපැල් - ymbacolombo@sltnet.lk
වෙබ් අඩවිය - www.ymba-colombo.org
2020.02.17